දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 පුනර් පරීක්ෂණය - 2018 ජුනි/ජූලි
Bachelor of Arts General (External) Degree Part I Repeat Examination 2014 – June/July 2018

සවිසා 2.2 - සමාජ විද්‍යාත්මක ක්‍රම
SGYG 2.2 - Sociological Methods

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න

---

01. i. සමාජ විද්‍යාව විද්‍යාත්මක විෂයයක් යයි ඔබ සිතන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 04)

ii. විද්‍යාත්මක ක්‍රමයේ මූලික පියවර මොනවා ද?

(ලකුණු 06)

iii. සමාජ විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමට බලපාන හේතු විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

02. i. දත්ත යනු මොනවා ද?

(ලකුණු 04)

ii. ප්‍රාථමික හා ද්විතියික දත්ත යනු මොනවාදැයි හඳුන්වා එම දත්ත ලබාගත හැකි ක්‍රම සැකෙවින් දක්වන්න.

(ලකුණු 06)

iii. ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත යනු මොනවාදැයි හඳුන්වා එම දත්ත සමාජ විද්‍යාත්මක අධ්‍යයන වල දී වැදගත් වන අයුරු විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

03. i. නියැදියක් යනු කුමක් ද?

(ලකුණු 04)

ii. සමාජ විද්‍යාත්මක අධ්‍යයනවල දී නියැදි ක්‍රම භාවිතා කරන්නේ කුමක් නිසාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii. සසම්භාවී, ස්ථරගත, හිමබෝල යන නියැදි ක්‍රමවලින් <u>එකක්</u> තෝරාගෙන එම නියැදි ක්‍රමය සමාජ විද්‍යාත්මක අධ්‍යයනවල දී යොදා ගත හැකි ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

04. i. පර්යේෂණ යෝජනාවලියක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 04)

ii. පර්යේෂණ යෝජනාවලියක මූලික පියවර සැකෙවින් දක්වන්න.

(ලකුණු 06)

iii. පර්යේෂණ යෝජනාවලියක් ගොඩනැංවීමේ ප්‍රයෝජන සහ එසේ නොමැති විට ඇතිවන සීමාවන් පෙන්වා දෙන්න.

(ලකුණු 10)

05. i. පර්යේෂණ වාර්තාවක් යනු කුමක් ද?

(ලකුණු 04)

ii. පර්යේෂණ වාර්තාවක මූලික පියවර මොනවා ද?

(ලකුණු 06)

iii. තෝරාගත් පර්යේෂණ ගැටළුවක් අධ්‍යයනය කිරීම සඳහා යොදාගත් ක්‍රමවේදය පිළිබඳව පර්යේෂණ වාර්තාවක ඇතුළත් කරන ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 10)

06. i. පර්යේෂණ සැළැස්මක් යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 04)

ii. සමාජ විද්‍යාවේ දී භාවිතා කළ හැකි ප්‍රධාන පර්යේෂණ සැළසුම් මොනවා ද?

(ලකුණු 06)

iii. "සමාජ විද්‍යාත්මක පර්යේෂණවල දී කිසියම් ගැටළුවකට අදාළව පර්යේෂණ සැළැස්ම ඉතා ප්‍රවේශමෙන් තෝරා ගත යුත්තකි" මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 10)

07. i. සමීක්ෂණයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 04)

ii. සමීක්ෂණ ක්‍රමයේ ප්‍රධාන පියවර මොනවා ද?

(ලකුණු 06)

iii. සමාජ විද්‍යාත්මක අධ්‍යයන වල දී සමීක්ෂණ ක්‍රමය භාවිතා කළ හැකි ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

08. පහත මාතෘකාවලින් දෙකක් (02) සඳහා සටහන් ලියන්න.

i. උපන්‍යාසය
ii. සිද්ධි අධ්‍යයන ක්‍රමය
iii. ප්‍රශ්න මාලාව
iv. සාහිත්‍ය විමර්ශණය

(සෑම කොටසකටම ලකුණු 10 බැගිනි)

************************************************************